**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 36/89**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1989 ජූනි මස 06 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## රාජ්‍ය භාෂා පිළිබඳ නීතිය ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ II වන පරිච්ඡේදයේ රාජ්‍ය භාෂාව පිළිබඳ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන සංග්‍රහය පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

02. පෙළෙහි වෙනයම් අන්දමකට දක්වා නැත්නම්, 1988. 12. 23 වන දින සිට මෙම සංශෝධන ක්‍රියාත්මක වේ.

03. ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ දැනට පවත්නා 7 : 1 : 1, 12 : 9, 12 : 10, 12 : 10 : 1, 12 : 10 : 2, 12 : 10 : 3, 12 : 10 : 4, 12 : 10 : 5, 12 : 10 : 6, 12 : 10 : 7, 12 : 10 : 8, 12 : 10 : 9 සහ 12 : 11 වගන්ති ඉවත් කර පහත දැක්වෙන වගන්ති ඇතුළත් කෙරේ.

(අ) "7 : 1 : 1 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමට අපොහොසත් වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරියෙකු නුසුදුස්සෙකු වේ."

(ආ) "12 : 9 සෑම නිලධාරියෙකුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා කලින් කල පනවනු ලබන අනෙකුත් නීති, රෙගුලාසි හා ව්‍යවස්ථාද පිළිපැදිය යුතුය. (කරුණාකර 5 වැනි පරිශිෂ්ඨය බලන්න.)"

(ඇ) "12 : 10 ස්ථිර හෝ තාවකාලික තනතුරු දරන්නාවූ ද, රජයේ භාෂා ප්‍රතිපත්ති කාර්යය සම්බන්ධයෙන් රජයේ සේවයෙහි නව ප්‍රවේශක යෙකු වන්නාවූ ද, රාජ්‍ය සේවයට බැඳුණු භාෂා මාධ්‍යය රාජ්‍ය භාෂා දෙකින් කුමක් හෝ නොවන්නාවූ ද, සෑම නිලධාරියෙකුම සිය පත්වීමේ දිනයේ සිට වසර තුනක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණ එනම්, I, II හා III ශ්‍රේණියේ පරීක්ෂණවලින් සමත් විය යුතුය.

1—D 005254—20,000 (89/06)

කෙසේ වෙතත්, එක් රාජ්‍ය භාෂාවකින් තමාගේ පාලනය යටතේ ඇති රාජ්‍ය ආයතනයකට හෝ සේවයට ඇතුළත් කරගනු ලබන රජයේ නිලධාරියෙකුට සිය ධුරයේ රාජකාරි ඉටුකිරීම සඳහා අනෙක් රාජ්‍ය භාෂාවේද ප්‍රමාණවත් දැනීමක් ලබාගැනීම අවශ්‍ය යයි පත්වීම් බලධරයෙකු අදහස් කරන්නේ නම්, එම සේවයට ඇතුළත් කර ගැනීමේ හෝ සේවයේ ස්ථිර කිරීමේ හෝ කොන්දේසියක් වශයෙන් එවැනි දැනීමක් ලබාගත යුතු යයි නියම කිරීම සඳහා එම තනතුරේ/සේවයේ බඳවා ගැනීමේ පටිපාටිය/සේවා ව්‍යවස්ථාව සංශෝධනය කරවා ගැනීමට ක්‍රියා කළ යුතුය. මෙම කොන්දේසිය එම තනතුරෙහි/සේවයෙහි පත්වීම් ලිපිවල ද ඇතුළත් කළ යුතුය."

i) "12 : 10 : 1 කණිෂ්ඨ සේවකයෙකු රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. කෙසේ වෙතත් යම්කිසි පත්වීම් බලධරයෙකුට තමාගේ දෙපාර්තමේන්තුවේ හෝ සේවා ස්ථානයේ සිටින යම් කණිෂ්ඨ සේවකයන් ගණයකට රාජ්‍ය භාෂාවක අවම නිපුණතාවයක් අවශ්‍යයයි හැඟෙන්නේ නම් ඔහු එවැනි කොන්දේසියක් නියම කිරීමට පූර්ව රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අවසරය ලබාගත යුතුය. එවැනි වෙනස් කිරීමකට අවසර දීමට පෙර රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ අදහස් විමසිය යුතුය."

) "12 : 10 : 2 රාජ්‍ය භාෂාවක් 'විෂයයෙහි ප්‍රවීණතාවය ලබාගත යුතුයයි නියම කරන සෑම නව ප්‍රවේශක නිලධාරියෙකුටම ඔහුගේ පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබාගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරතවෙමින් සිටියදී එම විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ. නියමිත අවුරුදු දෙක හමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ."

"12 : 10 : 3 එක් රාජ්‍ය භාෂාවක ප්‍රමාණවත් දැනීමක් ඇති නිලධරයෙකු අනෙක් රාජ්‍ය භාෂාවෙහි ප්‍රමාණවත් දැනීමක් ලබාගැනීම දිරිගන්වනු පිණිස රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පිළිගත් ආයතනයක් පවත්වනු ලබන පූර්ණ කාලීන භාෂා පාඨමාලාවලට සහභාගිවීම සඳහා හය මාසයක වැටුප් සහිත විශේෂ නිවාඩු නිලධාරියාගේ ඉල්ලීම මත සේවයේ අවශ්‍යතාවයන්ට යටත්ව ලබාදිය යුතුවේ. මෙය මෙම පරිච්ඡේදයේ 12 : 10 : 2 උප වගන්තිය යටතේ දෙනු ලබන නිවාඩුවලට අමතරවය."

) "12 : 10 : 4 නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගය සමත්වීමට නොහැකි වීමේ හේතුව නිසාම පමණක් තම පත්වීමේ ස්ථිර තර නොමැතිවූ දෙමළ මාධ්‍යයෙන් රජයේ සේවයට ඇතුළත් කරගනු ලැබූ සියළුම නිලධාරීන් 1988. 12. 23 වැනි දින සිට සිය තනතුරුවල ස්ථිර කළ යුතුය. එසේ ස්ථිර කරනු ලබන අවස්ථාවේ දී නිලධරයා සිටි ශ්‍රේණිය තුළ අත්හිටුවන ලද වේතනාධික අන් සියළුම අයුරින් උපයාගෙන ඇත් නම්

ඔහුට ආපසු ලබාදිය යුතුය. එසේ හෙයින් නිලධාරියාට එකී වේතනාධික නොවෙනස්ව ගෙවන ලද්දේ නම් නිලධාරියා එළඹෙන වැටුප් පිය වරෙයි ඊහිටුවන නමුත් වේතනාධිකවල කවර හෝ හිඟ මුදලක් නොගෙවනු ඇත."

(ඞ) "12 : 10 : 5 ආදී ප්‍රවේශක නිලධාරියෙකු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට අවශ්‍ය තත්ත්වයේ දෙමළ හෝ සිංහල භාෂා විභාගය කින් සමත්වී ඇත්නම් දෙවන භාෂාව පිළිබඳ විභාගය සමත්වීමෙන් ඔහු නිදහස් කළ හැකිය. එසේ නිදහස් කළ හැක්කේ එම නිලධාරියා සමත්වූ විභාගයේ භාෂා විෂය එම තනතුරට අදාළ බඳවා ගැනීම් පරිපාටියේ/සේවා ව්‍යවස්ථාවේ එසේ නිදහස් කිරීම සඳහා නියම කර ඇති භාෂා මාධ්‍යය වන්නේ නම් පමණි."

(ක) "12 : 10 : 6 දෙවන භාෂාව පිළිබඳ නියමය ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා වැටුප් වැඩිවීම් ප්‍රතිලාභ අහිමිවූ කවර හෝ ආදී ප්‍රවේශක නිලධාරි යෙකුට එකී අහිමිවූ ප්‍රතිලාභ හිඟ මුදල් ගෙවීමක් නොමැතිව 1980 ජූලි 9 දින සිට ලබාදිය යුතුය."

(ග) "12 : 11 පරිවාස කාලයකට යටත්ව හෝ සේවයෙහි ස්ථිර කිරීම් අදහස ඇතිව කිසියම් කාලයක වැඩබැලීමට හෝ පත්කරනු ලබන සෑම දෙමළ හෝ සිංහල නොවන මාධ්‍යයකින් සේවයට ඇතුළු වූ නිලධාරි යෙකුම රාජ්‍ය භාෂාවකින් ස්වකීය රාජකාරි කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් දැනුමක් එම කාලය ඇතුළතදී ලබා ගත යුතුය."

(ජ) "12 : 11 : 1 7 : 1 : 1, 12 : 9, 12 : 10, 12 : 10 : 1 12 : 10 : 2, 12 : 10 : 3 සහ 12 : 11 යන උපවගන්තිවල විධිවිධාන 1988. 12. 23 වෙනි දින සිට බලපැවැත්වෙනු ඇත."

04. පරිශිෂ්ඨ 3, 4 සහ 5 පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ:

(i) 3 වැනි පරිශිෂ්ඨය 1 වැනි ආදර්ශ කෙටුම්පත 4 වැනි වගන්තියේ අ(II) උප වගන්තිය පහත දැක්වෙන පරිදි ආදේශ කරන්න.

"(II) දෙකකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ අංක ගණිතය හෝ ගණිතය සහ සිංහල, දෙමළ හෝ අයදුම්කරු තෝරා ගන්නා වෙනත් භාෂාවක් යන විෂය යන් ඇතුළුව විෂයයන් සයකින් සමත්වී තිබීම."

(ii) 3 වැනි පරිශිෂ්ඨය II වැනි ආදර්ශ කෙටුම්පත 5(ඉ) වගන්තිය පහත දැක්වෙන පරිදි ආදේශ කරන්න.

"5 (ඉ) සිංහල හෝ දෙමළ භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය"

**(iii) 4 වැනි පරිශිෂ්ඨය 1 වැනි ආදර්ශ ලිපියෙහි 14, 15, 16 සහ 17 වගන්ති පහත දැක්වෙන පරිදි ආදේශ කරන්න.**

(අ) "14. ඔබ සේවයට ඇතුළත්වූ මාධ්‍යය රාජ්‍ය භාෂාවක් නොවන්නේ නම් පරිවාස කාලය ඇතුළත ඔබ රාජ්‍ය භාෂාවක් එනම් සිංහල හෝ දෙමළ විෂයයෙහි ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය. ඔබ තනතුරෙහි ස්ථිර කරනු ලැබීම රඳා පවත්නා කරුණු අතර සිංහල හෝ දෙමළ භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම ද එක් කරුණක් වනු ඇත."

(ආ) "15. ඉදින් පරිවාස කාලය තුළ ඔබගේ සේවය සතුටුදායක නොවුව හොත් සහ/හෝ සිංහල හෝ දෙමළ භාෂාවේ නියමිත තත්වයේ ප්‍රවීණතාවයක් ලබාගැනීමට ඔබ අපොහොසත් වුවහොත් පරිවාස කාලය ඇතුළත දී හෝ එය අවසානයේ දී හෝ ඔබගේ පත්වීම අවසන් කරනු ලැබේ.".

(ඇ) "16. ඉදින් පරිවාස කාලය තුළ ඔබගේ සේවය සතුටුදායකවී නම්ද, එසේම ඔබ සිංහල හෝ දෙමළ භාෂාවේ නියමිත තත්වයේ ප්‍රවීණතාවයක් ලබා තිබේ නම් ද, මෙහි 17 වැනි ඡේදයේ නියම කර ඇති කොන්දේසි සපුරා තිබේනම් ද එකී පරිවාස කාලය අව සානයේ දී ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 11 වැනි වගන්තිය යටතේ ඔබගේ තනතුරෙහි ස්ථිර කරනු ලැබේ."

(ඈ) "17. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයෙහි විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නා වූ හා මින් මතු පනවනු ලබන්නා වූ නීතිරීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව කටයුතු කරන බවට ඔබ එකඟවිය යුතුය"

**(iv) 4 වැනි පරිශිෂ්ඨය** II වැනි ආදර්ශ ලිපියෙහි 14 වගන්තිය පහත දැක්වෙන **පරිදි ආදේශ කරන්න.**

"14 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නාවූ හා මින්මතු පනවනු ලබන්නාවූ නීතිරීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව කටයුතු කරනු ලබන බවට ඔබ එකග විය යුතුය."

**(v) 4 වැනි පරිශිෂ්ඨය** III වැනි ආදර්ශ ලිපියෙහි 14 වගන්තිය පහත දැක්වෙන **පරිදි ආදේශ කරන්න.**

"14 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයෙහි විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නාවූ හා මින්මතු පනවනු ලබන්නා වූ නීතිරීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව කටයුතු කරන බවට ඔබ එකඟවිය යුතුය."

(vi) 4 වැනි පරිශිෂ්ඨය IV වැනි ආදර්ශ ලිපියෙහි 13 සහ 14 වගන්ති පහත දැක්වෙන පරිදි ආදේශ කරන්න.

(අ) "13. ඔබගේ පත්වීම කලින් අවසන් කරනු නොලැබුවහොත් නියමිත කාලපරිච්ඡේදය තුළදී සිංහල හෝ දෙමළ හෝ භාෂා ප්‍රවීණතා පරීක්ෂණ වලින් ඔබ සමත් විය යුතුය."

(ආ) "14. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයෙහි විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නාවූ හා මින්මතු පනවනු ලබන්නාවූ නීතිරීති හා ව්‍යවස්ථාවන්ට අනුකූලව කටයුතු කරන බවට ඔබ එකඟ විය යුතුය."

(vii) 4 වැනි පරිශිෂ්ඨය V වැනි ආදර්ශ ලිපියෙහි 3 (vi) වගන්ති පහත දැක්වෙන පරිදි ආදේශ කරන්න.

"3(vi) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයෙහි විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නාවූ හා මින්මතු පනවනු ලබන්නාවූ නීතිරීති හා ව්‍යවස්ථාවලට අනුකූලව කටයුතු කරන බවට ඔබ එකඟවිය යුතුය."

(viii) 4 වැනි පරිශිෂ්ඨය VI වැනි ආදර්ශ ලිපියෙහි II වගන්තිය පහත දැක්වෙන පරිදි ආදේශ කරන්න.

"ii ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයෙහි විධිවිධාන හා රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නාවූ හා මින් මතු පනවනු ලබන්නාවූ නීතිරීති හා ව්‍යවස්ථාවලට අනුකූලව කටයුතු කරන බවට ඔබ එකඟවිය යුතුය."

(ix) 5 වන පරිශිෂ්ඨය ලෙස 13 වන සහ 16 වන සංශෝධනයන් මගින් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV පරිච්ඡේදය ඇතුලත් කරන්න. 1989. 04. 18 දිනැති අංක 25/89 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි සංශෝධිත IV වැනි පරිච්ඡේදය උපුටා දක්වා ඇත.

05. ආයතන සංග්‍රහයෙහි සූචියේ "රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය" යන වචන යටතේ වගන්ති අංක 7 : 1 : 1, 12 : 10, 12 : 10 : 1, 12 : 10 : 2, 12 : 10 : 4, 12 : 11 සහ 12 : 11 : 1 ද ඇතුලත් කරන්න.

ලේකම්,

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.